# සාමවිනිසුරු අත්පොත

මෙය අධිකරණ අමාත්‍යාංශය සතු දේපළකි. අනවසරයෙන් උපුටා ගැනීම, මුද්‍රණය කර බෙදාහැරීම, අධිකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙන් බාගත කර මුද්‍රණය කර බෙදාහැරීම සපුරා තහනම්.

MOJ

# සාමවිනිසුරු අත්පොත: රෙගුලාසි සහ ආචාර ධර්ම

මෙම අත්පොත, **1978 අංක 2** දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සමඟ කියවෙන 61 වැනි වගන්තිය යටතේ අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පනවන ලද **2023 අංක 3** දරන **සාමවිනිසුරුවරුන් (පත්කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම සංග්‍රහය) රෙගුලාසි** සහ එහි පසුකාලීන සංශෝධන මත පදනම්ව, ශ්‍රී ලංකාවේ සාමවිනිසුරුවරුන් සඳහා වන රෙගුලාසි සහ ආචාර ධර්ම සංග්‍රහය සාරාංශ කරයි.

MOJ

# පටුන


| | | |
|---|---|---|
| 1 | නෛතික පදනම සහ පත්වීම් කාලය………. | 01 |
| 2 | පත්වීම් සඳහා සුදුසුකම්……………......... | 02 |
| 3 | පත්වීමේ වලංගුතාවය හා තනතුරෙහි දිවුරුම් දීම……………………………………….. | 04 |
| 4 | රාජකාරි, කාර්යයන්, සහ ආචාර ධර්ම සංග්‍රහය…………………………………….. | 05 |
| 5 | සාමවිනිසුරුවරයෙකු නොකළ යුතු දේ:……. | 09 |
| 6 | තොරතුරු ලේඛනය යාවත්කාලීන කිරීම සහ ජීවන සහතිකය ඉදිරිපත් කිරිම…………….. | 09 |
| 7 | පත්වීම අත්හිටුවීම සහ අවලංගු කිරීම……… | 11 |
| 8 | විනය පාලනය……………………………. | 13 |
| 9 | ඉල්ලා අස්වීම…………………………….. | 14 |
| 10 | පොදු උපදෙස්…………………………….. | 14 |
| 11 | උප ලේඛණ……………………………… | 17 |


MOJ

MOJ

# 1. නෛතික පදනම සහ පත්වීම් කාලය

## 1.1. පුද්ගල නාමයෙන් තැනැත්තන් සාමවිනිසුරුවරුන් ලෙස පත් කිරීම

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය යටතේ අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් 2023 අංක 3 දරන සාමවිනිසුරුවරුන් (පත්කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම සංග්‍රහය) රෙගුලාසි සහ එහි පසුකාලීන සංශෝධන මත පදනම්ව, ශ්‍රී ලංකාවේ සාමවිනිසුරුවරුන් සඳහා වන රෙගුලාසීන්ට අනුකූලව යහපත් සමාජ සේවයක නිරත වූ පුද්ගලයින් සහ සමාජයේ සම්භාවනීය පුරවැසියන් හට ගෞරවනීය තනතුරක් ලෙස සාමවිනිසුරු තනතුර පිරිනමනු ලබන අතර ධුර කාලය එකී රෙගුලාසි සහ එහි පසුකාලීන සංශෝධන මත පදනම්ව, ශ්‍රී ලංකාවේ සාමවිනිසුරුවරුන් සඳහා වන රෙගුලාසින්ට යටත්ව සහ අදාල සාමවිනිසුරුවරයා එම තනතුර දැරීම නුසුදුසු බවට අමාත්‍යවරයා විසින් තීරනය නොකරන්නේනම් සෑම සාමවිනිසුරුවරයෙකුම අවුරුදු හැත්තෑ පහ (75) සම්පූර්ණ වන තෙක් ධුරය දරනු ඇත.

**1.2. නිල බලයෙන් තැනැත්තන් සාමවිනිසුරුවරුන් ලෙස පත් කිරීම**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 (1) වැනි වගන්තිය යටතේ අධිකරණ විෂය භාර අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරන ගැසට් නිවේදනයන් මගින් රාජකාරීමය අවශ්‍යතාව මත රජයේ නිලයන් සඳහා නිල බලයෙන් සාමවිනිසුරු තනතුර පිරිනමනු ලබන අතර ධුර කාලය 2023 අංක 3 දරන සාමවිනිසුරුවරුන් (පත්කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම සංග්‍රහය) රෙගුලාසි සහ එහි පසුකාලීන සංශෝධන මත පදනම්ව, ශ්‍රී ලංකාවේ සාමවිනිසුරුවරුන් සඳහා වන රෙගුලාසින්ට යටත්ව එකී නිලය දරන කාලය සඳහා පමණක් වලංගු වේ.

**2. පත්වීම් සඳහා සුදුසුකම්**

**2.1. පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු** වශයෙන් පත් කරනු ලැබීම සඳහා සුදුසු පුද්ගලයෙකු විසින් පහත සඳහන් කරුණු සපුරාලිය යුතුය.

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම.
- වයස අවුරුදු තිහට (30) නොඅඩු සහ වයස අවුරුදු හැත්තෑ පහට (75) නොවැඩි තැනැත්තෙකු වීම.
- යහපත් චරිතයකින් යුක්ත, අවිවාදිත අවංකභාවයකින් යුක්ත සහ තම ප්‍රජාව විසින් හෝ රටේ ජනතාව විසින්

ගරු කරනු ලබන සහ විශ්වාසය තබන ලද තැනැත්තකු වීම.

- රාජ්‍ය භාෂාවන්ගෙන් එක් භාෂාවක් චතුර ලෙස කථා කිරීමේ, කියවීමේ සහ ලිවීමේ හැකියාව ඇති තැනැත්තකු වීම.
- (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ, කලින් කලට, වෙනස් කරනු ලැබිය හැකි පරිදි වූ රුපියල් දසදහසක් නොඉක්ම වූ දඩයක් නියම කරනු ලැබිය යුතු වරදකට හැර වෙනත් යම් අපරාධ චෝදනාවකට අධිකරණයක දී වරදකරුවකු නොවූ තැනැත්තකු වීම.
- බුන්වත් භාවයට පත් නොවූ තැනැත්තකු වීම.
- ප්‍රජාවට මනා සේවාවක් ලබා දුන් තැනැත්තකු වීම.
- යහපත් ශාරීරික සහ මානසික තත්ත්වයෙන් යුක්ත අයකු වීම.
- එක් වාරයකදී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ සිංහල හෝ දමිළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ද වෙනත් ඕනෑම විෂයකට තවත් සම්මාන සාමාර්ථයක් ද වන පරිදි සම්මාන සාමාර්ථ දෙකක්(02) සමඟ විෂයන් හයක්(06) සමත් තැනැත්තකු වීම.
- සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් මීට පෙර දී ලද පත්වීම අවලංගු කරනු ලැබ නොමැති හෝ අවසන් කරනු ලැබ නොමැති තැනැත්තකු වීම.
- සුවිශේෂී තත්ත්ව පිළිබඳ සටහන: සුවිශේෂී අවස්ථාවන්හිදී, අමාත්‍යවරයාගේ විශ්වාසය මත, යම්කිසි පුද්ගලයෙකු සමාජයට සපයා ඇති ආදර්ශවත් සේවය හෝ විශේෂිත නිපුණතාවයක් හෝ පළපුරුද්දක් සලකා බලා, ලිඛිතව හේතු දක්වමින්, අ.පො.ස. උසස්

පෙළ හෝ සාමාන්‍ය පෙළ සුදුසුකම් සපුරාලන්නේ නැති පුද්ගලයෙකු වුවද පත් කිරීමට අමාත්‍යවරයාට හැකිය.

**2.2. මූළ දිවයින සඳහා සාමවිනිසුරුවරයෙකු ලෙස පත් කිරීමට සුදුසු පුද්ගලයෙකු පහත සඳහන් කරුණු සපුරාලිය යුතුය:**

- ශ්‍රී ලංකා ජනරජය සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් පත් කරනු ලැබීමට සුදුසුකම්
- අවුරුදු පහට(05) නොඅඩු කාලසීමාවක් සඳහා පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහා සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් ධූරය දරා තිබීම
- අ.පො.ස. උසස් පෙළ විභාගයේදී එක් (01) විෂයයක් සමත් වී තිබීම.

සටහන: අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය සුදුසුකම් ලත් පුද්ගලයෙකුට ලිඛිතව අමාත්‍යවරයා වෙත අයදුම්පත යොමු කළ හැක. අයදුම්පතට, අයදුම්කරු යහපත් ශාරීරික හා මානසික තත්ත්වයක සිටින බව තහවුරු කරන, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ඇතුළත් විය යුතුය.

## 3. පත්වීමේ වලංගුතාවය හා තනතුරෙහි දිවුරුම් දීම

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය සහ 2023 අංක 3 දරන සාමවිනිසුරුවරුන් (පත්කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම සංග්‍රහය) රෙගුලාසි සහ එහි පසුකාලීන සංශෝධන මත

පදනම්ව, අධිකරණ අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබූ තැනැත්තන් සාමවිනිසුරුවරුන් ලෙස ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරනු ලබන දැන්වීමක් මගින් ප්‍රසිද්ධියට පත් කරනු ලබයි.

එකී ගැසට් පත්‍රයට අනුකූලව සාමවිනිසුරුවරුන් ලෙස පත්වීම් ලිපි ලබා දීම සිදු කරනු ලබයි.

එම පත්වීම් ලිපියට අනුව අදාල අධිකරණයේදී සාමදාන විනිශ්චකරවරයකු ලෙස දිවුරුම් දීමෙන් අනතුරුව 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වැනි වගන්තිය ප්‍රකාරව පිරිනමන ලද සාමදාන විනිශ්චකාර තනතුර වලංගු වේ.

සටහන: 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 (1) වැනි වගන්තිය යටතේ නිල බලයෙන් ලබා දෙනු ලබන සාමවිනිසුරු තනතුරු සඳහා දිවුරුම් දීම අවශ්‍ය නොවන අතර එකී නිලය දරන තාක් කල් පමණක් වලංගු වේ.

## 4. රාජකාරි, කාර්යයන්, සහ ආචාර ධර්ම සංග්‍රහය

2023 අංක 03 දරන සාමවිනිසුරුවරුන් (පත්කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම සංග්‍රහය) රෙගුලාසින්හි සඳහන් දෙවන උපලේඛනයෙහි සඳහන් සාමවිනිසුරුවරුන් සඳහා වන ආචාර ධර්ම සංග්‍රහය සෑම සාමවිනිසුරුවරයෙකුම අනුගමනය කළ යුතුය. එම ආචාර ධර්ම සංග්‍රහය අනුගමනය කිරීමට අපොහොසත් වීම වැරදි

හැසිරීමක් ලෙස සැලකෙනු ලබන අතර අමාත්‍යවරයා විසින් තනතුරෙන් පහ කිරීමටද හේතු විය හැක.

## 4.1 ලේඛන සත්‍යාපණය කිරිම

- ලියාපදිංචි විස්තර: සෑම සාමවිනිසුරුවරයකු විසින්ම තමා අත්සන් කරන ලද ලේඛනය මත මුලකුරු සහිතව සම්පූර්ණ නම, අත්සන, දිනය, ලියාපදිංචි අංකය සහ දුරකථන අංකය පැහැදිලිව සටහන් කළ යුතු අතර සිය නිල මුද්‍රාව ද තැබීම අනිවාර්යය වේ.
- මුල් ලේඛන අවශ්‍යයි: මුල් ලේඛනය ඉදිරිපත් කර පරීක්ෂා කර ඇති තාක් සහ ලේඛනයට අත්සන් කරන පුද්ගලයාගේ අනන්‍යතාවය පිළිබඳව සෑම සාමවිනිසුරුවරයෙකුම තෘප්තිමත් වන්නේ නම් මිස, කිසිවිටෙක ලේඛනයක් සහතික නොකළ යුතුය.
- භෞතික පැමිණීම: සාමවිනිසුරුවරයෙකු ඉදිරියේ අත්සන් කිරීමට හෝ සත්‍යාපණය කිරීමට අවශ්‍ය ඕනෑම ප්‍රකාශයක් හෝ ලේඛනයක් ඔහු ඉදිරියේදී සිදු කර ඇති බව තහවුරු කළ යුතුය.
- තොරතුරුවල අවංකභාවය: ඔවුන්ගේ දැනුමට අනුව වංචනික හා වැරදි තොරතුරු අඩංගු වන කිසිදු ලේඛනයක් හෝ දිවුරුම් ප්‍රකාශයක් සාක්ෂි නොදැරිය යුතුය, සත්‍යාපණය නොකළ යුතුය, ප්‍රකාශ නොකළ යුතුය, හෝ අත්සන් නොකළ යුතුය.
- ලබැදියාවන් පිළිබඳ ගැටුමක් ඇති නොවන අයුරින් කටයුතු කිරීම: තමාගේම හෝ සමීපතම ඥාතීන්ගේ ලිපි ලේඛන තහවුරු කිරීමෙන් වැලකී සිටිය යුතුය.
- බල සීමාව : ස්වකීය සාම විනිසුරු පත්වීම මුළු දිවයින සඳහාම ලැබී ඇත්නම් දිවයිනේ ඕනෑම

ස්ථානයක සිට ලිපි ලේඛන සහතික කිරීම කල හැකි අතර, ස්වකිය සාම විනිසුරු පත්වීම කලාපයක් (පරිපාලන දිස්තික්කයක්) සඳහා පමණක් ලැබී ඇත්නම්, දිවයිනේ ඕනෑම පුද්ගලයකුගේ ලිපි ලේඛන ස්වකිය සාම විනිසුරු පත්වීම හිමි කලාපය (පරිපාලන දිස්ත්‍රික්කය) ඇතුලතදී සහතික කිරීම කල හැකිය.

- භාෂා මාධ්‍යය /ඉංග්‍රීසි භාෂා ලේඛන: ඕනෑම සාමවිනිසුරුවරයකු ඉංග්‍රීසි භාෂාවෙන් කටයුතු කිරීම සඳහා අධිකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙතින් ලිඛිත අනුමැතියක් ලබාගත යුතු වේ.

## 4.2. දිවුරුම් ප්‍රකාශ ලබා දීම

සියලුම දිවුරුම් ප්‍රකාශයන්, අධිකරණ ආඥා පනතේ 49 වන වගන්තිය යටතේ නියම කරන ලද නීතිරීතිවලට අනුකූලව, කලින් කලට නියම කළ හැකි පෝරම සහ විධිමත්භාවයන් අනුව ලබා දිය යුතුය.

විකල්ප/විශේෂ දිවුරුම්

කිසියම් පාර්ශ්වයක් හෝ සාක්ෂිකරුවෙකු තමා අයත් වන ජාතියට හෝ ආගමික විශ්වාසයට පොදු වූ හෝ බැඳීමක් ලෙස සලකන යම් ආකාරයක දිවුරුමක් හෝ ස්ථිර ප්‍රකාශයක් මත සාක්ෂි දීමට ඉදිරිපත් වන්නේ නම්, එම දිවුරුම යුක්තියට හෝ විනීතභාවයට පටහැනි නොවන්නේනම් සහ කිසිදු තෙවැනි පුද්ගලයෙකුට බලපෑමක් කිරීමට අදහස් නොකරන්නේ නම්, අධිකරණය

සුදුසු යැයි සිතන්නේ නම්, එවැනි දිවුරුමක් හෝ ස්ථිර ප්‍රකාශයක් ඔහුට/ඇයට ලබා දීමට කටයුතු කළ හැකිය.

---

## 4.3. පොදු සේවා මූලධර්ම සාමවිනිසුරුවරයෙකු විසින් පහත සඳහන් දේ කළ යුතුය:

- තොරතුරු හෙලිකරන්නෙකු ලෙස කටයුතු කිරීම: සමාජ විරෝධි ක්‍රියාකාරකම් වැලැක්වීම හා අවම කිරීම සඳහා අදාළ නිලධාරීන් හට තොරතුරු හෙළිකිරිම සහ ඔවුන් සමග එක්ව සමග කටයුතු කිරීම.
- සාම නිලධාරියකු ලෙස කටයුතු කිරීම: ගැටුම්කාරී අවස්ථාවලදී අදාල සියලු පාර්ශවයන්ගේ විශ්වාසය දිනාගත් පුද්ගලයකු ලෙස ගැටුම් සමථකරණය සඳහා මැදිහත් වීම
- ආචාරශීලී බවින්, ගෞරවයෙන් හා අභිමානයෙන් සේවා සැපයීම සහ ඉල්ලීම්වලට කාලෝචිත ආකාරයෙන් කටයුතු කිරීම.
- තම හැකියාවෙන් උපරිමයෙන් වෘත්තීය වශයෙන්, සාධාරණව, කඩිසරව සහ කඩිනමින් කටයුතු කිරීම.
- අවංකභාවයෙන් හා ස්වාධීනව කටයුතු කිරීම.
- සැම විටම මහජනතාවගේ යහපත උදෙසා කටයුතු කිරීම සහ ස්වාධීන හා අපක්ෂපාතීව සිටීම.

- තොරතුරුවල රහස්‍යභාවය සහ පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම, නීතියෙන් අවශ්‍ය වන තොරතුරු පමණක් හෙළිදරව් කිරීම.

## 5. සාමවිනිසුරුවරයෙකු නොකළ යුතු දේ:

- සාමවිනිසුරු තත්ත්වය තුළ නෛතික උපදෙස් ලබා දීම.
- සේවා සැපයීම සඳහා හෝ සපයන ලද සේවාවක් සඳහා ගාස්තුවක් අය කිරීම හෝ තෑගි හෝග භාර ගැනීම හෝ වෙනත් ලාභ ප්‍රයෝජන ලබා ගැනිම.
- වංක හෝ නීති විරෝධී කටයුතුවල නිරත වීම.
- ඕනෑම ව්‍යාපාරික, වාණිජ හෝ පුද්ගලික ගනුදෙනුවක් හෝ ආරවුලක් තුළ තම අවශ්‍යතා ඉදිරියට ගෙන යාමට විශේෂ අධිකාරියක්, විශ්වසනීයත්වයක් හෝ තත්ත්වයක් තහවුරු කිරීමට හෝ ඇඟවීමට සාමවිනිසුරු තනතුර භාවිත කිරීම.
- සාමවිනිසුරු තනතුර භාවිතයෙන් පුද්ගලික ප්‍රතිලාභ ලබා ගැනීමට කිසියම් සංගමයකට එකතු වීම හෝ නිර්මාණය කිරීම.
- ධුරයට අගෞරවයක් හෝ මහජන අපහාසයක් ඇති වන හෝ මහජන අපකීර්තියක් ඇති කළ හැකි ආකාරයෙන් විද්‍යුත් මාධ්‍යයන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සහ හෝ සමාජයෙහි හැසිරීම.
-

## 6. තොරතුරු ලේඛනය යාවත්කාලීන කිරීම සහ ජීවන සහතිකය ඉදිරිපත් කිරිම

**6.1. අධිකරණ අමාත්‍යාංශය විසින් සාමදාන විනිශ්චයකාරවරයන්ගේ පහත සඳහන් තොරතුරු ඇතුළත් ලියාපදිංචි** ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර එකී තොරතුරු හි යම් වෙනසක් පවතී නම් හෝ සිදුවුනහොත්, උප ලේඛණය II හි දක්වා ඇති ආකෘති පත්‍රය මගින් අධිකරණ අමාත්‍යාංශය **කඩිනමින් දැනුවත් කිරීම සිදු කළ යුතුය.**

- සම්පූර්ණ නම
- උපන් දිනය
- ජාතික හැඳුනුම්පත් අංකය
- පදිංචි ලිපිනය සහ දුරකථන අංක (ජංගම සහ ස්ථාවර)
- පත්වීම් දිනය, ලියාපදිංචි අංකය සහ අධිකරණ බලප්‍රදේශය.
- මිය ගිය දිනය (ස්වකීය අභාවය සිදු වූ විට ග්‍රාම නිලධාරිවරයා හරහා ලිඛිතව අධිකරණ අමාත්‍යාංශය වෙත හැකි ඉක්මනින් එම තොරතුරු ඉදිරිපත් කිරිම සඳහා සියලුම සාමදාන විනිශ්චයකාරවරුන් පවුලේ සමීපතම ඥාතීන් දැනුවත්කර තිබිය යුතු ය.)

## 6.2. ජීවන සහතිකය ඉදිරිපත් කිරීම

තොරතුරු ලේඛනය යාවත්කාලීන කිරීමේ කාර්යය සඳහා, සෑම සාමදාන විනිශ්චයකාරවරයකු විසින් ම, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘති පත්‍රයට අනුකූලව අදාළ ග්‍රාම නිළධාරියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කරන ලද ජීවන සහතිකයක්, සෑම වසර දෙකකට වරක් ම මාර්තු තිස් එක (31) වන දින හෝ එදිනට පෙරාතුව ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

අදාළ ග්‍රාම නිලධාරීවරයා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතික කරන ලද ජීවන සහතිකය, සාමදාන විනිශ්චයකාරවරයා යහපත් ශාරීරික සහ මානසික තත්ත්වයකින් යුක්ත වන බව සහතික කරමින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයකු විසින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ද සමඟ ඉදිරිපත් කළ යුතුය.

ඉදිරිපත් නොකිරීමේ ප්‍රතිවිපාකය: අමාත්‍යවරයා විසින්, සාධාරණ බවට සලකනු ලබන හේතු මත හැර, වෛද්‍ය සහතිකය සමඟ එකී ජීවන සහතිකය වසර 02 කට වරක් ඉදිරිපත් කිරීම පැහැර හරින සෑම සාමදාන විනිශ්චයකාරවරයකු ම, එකී සහතිකය ඉදිරිපත් කිරිමට නියමිතව තිබු අවසන් දිනයේ සිට එනම් එම වසරේ මාර්තු 31 වන දින සිට ධුරයෙන් ඉල්ලා අස් වූ බවට සලකනු ලැබේ.

ඔවුනට එතැන් පටන් සාමදාන ධුරයේ රාජකාරි ඉටු කිරීම අනවසර ක්‍රියාවක් වේ.

## 7. පත්වීම අත්හිටුවීම සහ අවලංගු කිරීම

සෑම සාමදාන විනිශ්චයකාරවරයකු විසින් ම, 2023 අංක 3 දරන සාමවිනිසුරුවරුන් (පත්කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම සංග්‍රහය) රෙගුලාසීන් හි II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති සාමදාන විනිශ්චයකාරවරුන් සඳහා වන ආචාරධර්ම පද්ධතියේ විධිවිධාන පිළිපැදිය යුතු අතර, එසේ කිරීම පැහැර හැරීම, පිරිනමන ලද තනතුරේ විෂමාචාර ක්‍රියාවක් විය යුතු අතර, අමාත්‍යවරයා විසින් ස්වකීය අත්සන යටතේ වන ලිඛිත දැන්වීමක් මගින් සාමදාන විනිශ්චයකාර ධුරයෙන් ඉවත් කිරීමකට යටත් විය යුතු ය.

**සාමදාන විනිශ්චයකාරවරයකු වශයෙන් පත්කරන ලද තැනැත්තකු විසින් -**

- පත්වීම ලබා මාස තුනක් ඇතුළත දිවුරුම් දීම පැහැර හරින
- ඔහුගේ පත්වීමට අදාළ යම් කොන්දේසියකට අනුකූලවීම පැහැර හරින
- යම් අපරාධ චෝදනාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ වරදකරු වන
- බුන්වත් බවට යම් අධිකරණයක් විසින් ප්‍රකාශ කරනු ලබන

- ධුරයේ කර්තව්‍ය සිදුකරගෙන යාම සඳහා ශාරීරික හා මානසික වශයෙන් යෝග්‍ය නොවන විට
- ස්වකීය අධිකාරිය අයුතු ලෙස භාවිතා කිරීමට වරදකරු වන
- 7 වන නියෝගය යටතේ නිශ්චිතව දක්වා ඇති සාමදාන විනිශ්චයකාරවරයන් සඳහා වන ආචාර ධර්ම පද්ධතියේ යම් විධිවිධානයක් උල්ලංඝනය කිරීමෙන් විෂමාචාර ක්‍රියාවකට වරදකරු වන බව සොයා දැනගනු ලබන,

අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් සාමදාන විනිශ්චයකාර පත්වීමක් අවලංගු හෝ අවසන් කරනු ලැබිය හැකිය.

## 8. විනය පාලනය

සියළුම සාමදාන විනිසුරුවරුන් සම්බන්දයෙන් විනය පාලන බලතල අධිකරණ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් සතු වන අතර ඔහු /ඇය විසින් කලින් කලට ලබාදෙන උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ නියෝග පැහැර හැරීමක් සම්බන්ධව හෝ 2023 අංක 3 දරන සාමවිනිසුරුවරුන් (පත්කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම සංග්‍රහය) රෙගුලාසීන්හි ආචාර ධර්ම කඩකිරීමක් හෝ තනතුර අවභාවිතා වන අයුතු යොදාගැනීමක් සම්බන්ධව අධිකරණ අමාත්‍යාංශය වෙත ලැබෙන යම් පැමිණිල්ලක්, චෝදනාවක් හෝ පෙත්සමක් හෝ මත අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින්

නම්කරන නිලධාරියෙකු මගින් සිදුකරනු ලබන විමර්ශනයෙන් අනතුරුව විනය පියවර ගනු ලැබේ.

අවස්ථානුගත කරුණු මත පරීක්ෂණ අවසන් වන තෙක් අමාත්‍යවරයාගේ එකඟතාව මත සාමදාන විනිසුරු පත්වීම තාවකාලිකව අත්හිටුවීමද සිදු කරනු ඇත.

එම විමර්ශනයේ දී අදාළ චෝදනාව සම්බන්ධයෙන් වැරදිකරු බවට අනාවරණය වුවහොත් අධිකරණ විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාව මත සමාදාන විනිසුරු පත්වීම අවලංගු කරනු ලැබේ.

## 9. ඉල්ලා අස්වීම

සාමදාන විනිශ්වයකාරවරයකු තත්කාර්ය සඳහා අමාත්‍යවරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරිම මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

## 10. පොදු උපදෙස්

### 10.1 නිල මුද්‍රාව, ලියුම් ශීර්ෂය සහ දැන්වීම් පුවරු

- **මුද්‍රාව/ලියුම් ශීර්ෂය:**
  සාමදාන විනිශ්වයකාරවරයකු විසින්, මුද්‍රාව සහ ලිපි ශීර්ෂය, දෘඩ පිටපතක් වුව ද, විද්‍යුත් පිටපතක්

වුව ද, ස්වකීය ලියාපදිංචි අංකය එහි සඳහන් කළ යුතු අතර රාජ්‍ය ලාංඡනය භාවිතා නොකළ යුතු ය.

- **නාම පුවරු:** සාමදාන විනිශ්චයකාරවරයකුට තමා ඒ ධුරයේ සේවා ඉටුකරන බවට දැනුම්දීම සඳහා, අවස්ථාවෝචිත පරිදි දෘඩ පිටපතකින් හෝ විද්‍යුත් පිටපතකින් හෝ ව්‍යාපාර කාඩ්පත්වල හෝ ලිපි ශීර්ෂවල ස්වකීය නමට පසුව විරුද නාමයක් ලෙස භාවිත කිරීම ඇතුළුව සිය කාර්යාලයේ හෝ පදිංචි ස්ථානයේ සාමදාන විනිශ්චයකාර නාම පුවරු ප්‍රදර්ශනය කිරීම සිදු කළ හැකි ය.

**10.2** සාමදාන විනිශ්චයකාරවරයකු විසින්, පහත දැක්වෙන යම් වෙනසක් ඇති වීමෙන් පසුව, හැකි ඉක්මනින් ඒ පිළිබඳව ලිඛිතව ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු ය.

- සාමදාන විනිශ්චයකාරවරයාගේ නමේ වෙනසක්.
- පදිංචි ලිපිනයේ හෝ දුරකථන අංකයේ වෙනසක්.

# 11. උප ලේඛණ

| | | |
|---|---|---|
| | උප ලේඛණය I | ජීවන සහතිකය |
| | උප ලේඛණය II | තොරතුරු යාවත්කාලීන කිරීමේ අයදුම්පත්‍රය |
| | උප ලේඛණය III | දිවුරුම් ප්‍රකාශයක ආකෘතිය |
| | උප ලේඛණය IV | නිවැරදි නිල මුද්‍රාවක ආකෘතිය |
| | උප ලේඛණය V | 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනත මගින් දක්වා ඇති නිල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ සාමදාන විනිශ්චයකාරවරුන් |
| | උප ලේඛණය VI | 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනත මගින් දක්වා ඇති නිල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ කොටස් සඳහා සාමදාන විනිශ්චයකාරවරුන් |
| | උප ලේඛණය VII | 1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වන වගන්තියේ 1(අ) වන උපවගන්තියට අනුව අධිකරණ අමාත්‍යතුමා විසින් සාදන ලද නියෝග අනුව නිල බලයෙන් පත්වන සාම විනිසුරුවරුන් |

*උපලේඛණය I*

**ජීවන සහතිකය**

**................................(වර්ෂය)**

සාමදාන විනිශ්චයකාරවරුන් සම්බන්ධ නියෝග (පත් කිරීම, අත්හිටු වීම, අවලංගු කිරීම සහ ආචාර ධර්ම පද්ධතිය)

සාමදාන විනිශ්චයකාරවරුන් සඳහා උපදෙස්

1. මෙම සහතිකය, ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට වර්ෂ දෙකකින් කල් ඉකුත් වේ.

2. සම්පූර්ණ ආකෘති පත්‍රය පිරවීමට කාරුණික වන්න.

3. අත්සන සහ නිල මුද්‍රාව සම්පූර්ණ බවට සහතික කිරීමට කාරුණික වන්න. නොඑසේ නම් සහතිකය ප්‍රතික්ෂේප වනු ඇත.

4. ජාතික හැඳුනුම්පතෙහි/ විදේශ ගමන් බලපත්‍රයෙහි යම් වෙනසක් සිදුවුවහොත්, අදාළ පිටපත් අමුණා ඉදිරිපත් කළ යුතුය

5. ද්විවාර්ෂිකව, මාර්තු 31 වන දිනට පෙරාතුව සහතිකය එවීම පැහැර හැරීම, 6(2) නියෝගයට අනුව සාමදාන විනිශ්චයකාර ධුරයෙන් ඉල්ලා අස්වීම වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**1. කාර්යාලයීය තොරතුරු:**

1.1 ලියාපදිංචි අංකය:........................................

1.2 පත්වීමේ දිනය :...........................................

1.3 අධිකරණ බල ප්‍රදේශය:................................

2. **පෞද්ගලික තොරතුරු:**

2.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි) .....................................

2.2 සම්පූර්ණ නම(සිංහල/දෙමළ) ..........................

2.3 ඔබගේ නම වෙනස් වී තිබේද? - ඔව්/නැත

වෙනස් වී තිබේ නම්,

2.3.1. සම්පූර්ණ නම(ඉංග්‍රීසි) :..................

2.3.2. සම්පූර්ණ

නම(සිංහල/දෙමළ)..........................

2.4 උපන් දිනය .........................

2.5 ස්ථිර ලිපිනය ............................

2.6 තාවකාලික ලිපිනය, තිබේනම් ........................

2.7 සම්බන්ධ කරගැනීමේ විස්තර -

2.7.1. ජංගම - ..............ස්ථාවර - ..................

2.7.2. විද්‍යුත් තැපැල් ලිපිනය........................

**3. හඳුනා ගැනීමේ තොරතුරු :**

3.1 ජාතික හැඳුනුම්පත් අංකය :...................

3.2 පුරවැසි කාඩ්පත :.....................

MOJ

3.3 විදේශ ගමන් බලපත්‍ර අංකය (තිබේ නම්)

| *විදේශ ගමන් බලපත්‍ර අංකය* | *නිකුත්කළ දිනය* | *ඉකුත්වන දිනය* | *නිකුත්කළ රට* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

**4. ප්‍රකාශය :**

ඉහත සඳහන් තොරතුරු මාගේ දැනුමට අනුව සත්‍ය සහ නිවැරදි බව මම මෙයින් ප්‍රකාශ කර සිටින අතර, මා විසින්, ලේඛන පිටපත් අවශ්‍ය පරිදි මේ සමග අමුණා ඇත.

සාමදාන විනිශ්චයකාරවරයාගේ අත්සන

දිනය :...................................

**5. සහතික කිරීම**

5.1 ග්‍රාම නිලධාරීවරයාගේ සහතිකය

ලියාපදිංචි අංක ................................................

යටතේ සාමදාන විනිශ්චයකාර ධුරය දරන

...................................මයා/මිය/පූජ්‍ය/ආචාර්ය

මා විසින් දැක ඇති බවටත්, මේ දිනය වනවිට ඔහු / ඇය ජීවත්ව සිටින බවටත්, ධුරයේ කර්තව්‍ය සිදුකරගෙන යාම සඳහා බැලූ බැල්මට පෙනෙන ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් පසුවන බවටත් සහතික කරමි.

ග්‍රාම නිලධාරි ගේ අත්සන
දිනය ..........................................

5.2. ප්‍රාදේශීය ලේකම්වරයා විසින් සහතිකය අනුමත කිරීම

සාමදාන විනිශ්චයකාරවරයා ජීවත්ව සිටින බවට සහ ධුරයේ කර්තව්‍ය සිදු කරගෙන යාම සඳහා බැලූ බැල්මට පෙනෙන ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් පසුවන බවට වන ග්‍රාම නිලධාරිවරයාගේ සහතිකය, මම අනුමත කරමි

ප්‍රාදේශීය ලේකම්වරයාගේ අත්සන

මුද්‍රාව ........................................................

දිනය :........................................................

MOJ

*උපලේඛණය II*

| JP Reg No. | |
|---|---|

**අධිකරණ අමාත්‍යාංශය**

**තොරතුරු යාවත්කාලීන කිරීමේ අයදුම්පත්‍රය**

ඔබ විසින් පූර්ව පත්වීම සඳහා ලබා දෙනු ලැබූ පහත තොරතුරුහි යම් වෙනසක් පවතී නම් සංශෝධනය සඳහා මෙම ආකෘතියෙහි වෙනස් වූ තොරතුරු පමණක් සම්පූර්ණ කළ යුතුය.

1. **නම: සංශෝධනය විය යුතු පරිදි නම සඳහන් කළ යුතු අතර එය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම් පතෙහි සහතික පිටපතක් ඇමිණිය යුතුය.**

**සම්පූර්ණ නම (සිංහල/දෙමළ භාෂාවෙන්)** ____________________

සම්පූර්ණ නම (ඉංග්‍රීසි භාෂාවෙන්) ____________________

2. **ස්ථිර ලිපිනය: සංශෝධිත ලිපිනය සඳහන් කළ යුතු අතර එය තහවුරු කිරීම සඳහා ග්‍රාම නිලධාරී වෙතින් ලබා ගත් පදිංචි සහතිකයක් ඇමිණිය යුතුය.**

ස්ථිර ලිපිනය(සිංහල /දෙමළ භාෂාවෙන්) ____________________

ස්ථිර ලිපිනය(ඉංග්‍රීසි භාෂාවෙන්) ____________________

**සංශෝධිත පදිංචි ස්ථානයට අයත් අධිකරණ/ පොලිස්/පරිපාලන කලාප**

| | | | | | |
|---|---|---|---|---|---|
| මහාධිකරණය | | දිසා අධිකරණය | | මහෙස්ත්‍රාත් | |
| පොලිස් ස්ථානය | | දිස්ත්‍රික්කය | | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |

3. **හැඳුනුම්පත් අංකය: සංශෝධනය විය යුතු අංකය සඳහන් කළ යුතු අතර එය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම් පතෙහි සහතික පිටපතක් ඇමිණිය යුතුය.**

ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐☐☐

4. **සම්බන්ධ කරගැනීමේ තොරතුරු: සංශෝධනය විය යුතු තොරතුරු ඇතුලත් කරන්න.**

ජංගම දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐ ස්ථාවර දුරකථන අංකය ☐☐☐☐☐☐☐☐☐☐

ඉලෙක්ට්‍රොනික් තැපැල ____________________

5. **අධ්‍යාපනික සුදුසුකම්: සංශෝධනය විය යුතු අධ්‍යාපනික සුදුසුකම් ඇතුලත් කරන්න.**

අධ්‍යාපනික සුදුසුකම්

අ.පො.ස සාමාන්‍ය පෙළ — විභාග අංකය ____

| | |
|---|---|
| විශිෂ්ට | |
| අධිසම්මාන | |
| සම්මාන | |
| සාමාන්‍ය | |
| දුර්වල | |

අ.පො.ස උසස් පෙළ — විභාග අංකය ____

| | |
|---|---|
| විශිෂ්ට | |
| අධිසම්මාන | |
| සම්මාන | |
| සාමාන්‍ය | |
| දුර්වල | |

**<u>භාෂා ප්‍රවීණතාව</u>**

**අ.පො.ස. සාමාන්‍ය පෙළ/G.C.E.(O/L.)** **විභාග අංකය** **වර්ෂය**

මව් භාෂාව (සිංහල/දෙමළ)) ...................... ඉංග්‍රීසි භාෂාව......................

**මෙතෙක් ලබාඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම** ____________________

ඉහත දක්වා ඇති කරුණු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය - ..................................................................

අත්සන

*උපලේඛණය III*

# දිවුරුම් ප්‍රකාශයක ආකෘතියක්

## දිවුරුම් ප්‍රකාශයයි

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ, පිළියන්දල, මොරටුව පාරේ, අංක 142/6 දරන ස්ථානයේ පදිංචි චන්ද්‍රාවතී සතරසිංහ වන මම, බෞද්ධාගම්කාරියක වශයෙන් ගෞරව බහුමානයෙන් යුක්තව ද , අවංකවද, සත්‍ය ලෙසද ප්‍රතිඥා දී මෙහි පහත සඳහන් පරිදි ප්‍රකාශ කරමි.

1. මෙම දිවුරුම් ප්‍රකාශයේ ඉහත නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක මම වෙමි.

2. මාගේ ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය 372667550V

3. මාගේ පුත්‍රයා වන ගයාන් විජයන්ත යන අය විසින් මා හට ඇටෝර්නි බලය පවරමින් ඇටෝර්නි බලපත්‍රයක් 2005 ජුලි මස 23 වැනි දින පිළියන්දල දී අත්සන් කරන ලද අතර, එම බලපත්‍රයේ අංකය 266 වේ.

4. එම ඇටෝර්නි බලපත්‍රය 2007 අගෝස්තු මස 06 වැනි දින රජයේ ලියාපදිංචි කර ඇත.

5. එකී අංක 266 දරන ඇටෝර්නි බලපත්‍රය අද දක්වා ම වලංගුව පවතින අතර, කිසිවිටෙක එය අවලංගුකර නැත.

…………………………..

දිවුරුම් ප්‍රකාශක.

(දිවුරුම් ප්‍රකාශක විසින් රු.50ක මුද්දර මත අත්සන් තැබීම අනිවාර්ය වේ.)

ඉහත සඳහන් ප්‍රකාශය කියවා තේරුම් කර දෙන ලදුව, ඇය විසින් එකී කරුණු තේරුම්ගත් බවට සෑහීමකට පත්වීමෙන් 2007 සැප්තැම්බර් මස 28 වැනි දින කොළඹ දී මා ඉදිරිපිට දී ස්වකීය අත්සන යොදන ලදී.

.....................................
සාමදානය විනිශ්චයකාර
(නිල මුද්‍රාව)

සැ.යු. - දිවුරුම් ප්‍රකාශනයකට තැබිය යුතු මුද්දර ගාස්තුව කලින් කලට වෙනස් විය හැකිය.

MOJ

*උපලේඛණය IV*

## නිවැරදි නිල මුද්‍රාවක ආකෘතියක්

ඔබගේ පත්වීම් ලිපියේ නම : සමරසිංහ මුදියන්සේලාගේ අශෝක නන්දන විජේවික්‍රම සමරසිංහ නම්, එස්.එම්.ඒ.එන්.ඩබ්. සමරසිංහ හෝ එස්.එම්.ඒ. නන්දන විජේවික්‍රම සමරසිංහ ලෙස නිල මුද්‍රාවේ සඳහන් කළ යුතුය.

ඔබගේ ලිපිනය : ලිපිනය අංක 4, නව මාවත, අතුරුගිරිය නම් ද,

ඔබගේ ලියාපදිංචි අංකය : පත්වීම් ලිපියේ 8 වන ඡේදයේ සඳහන් ලියාපදිංචි අංකය 10/07/බප/මුදි/23 නම් ද,

| |
|---|
| එස්.එම්.ඒ.එන්.ඩබ්. සමරසිංහ<br>සාම විනිසුරු<br>අංක 4,නව මාවත, අතුරුගිරිය<br>10/07/බප/මුදි/23<br>දුරකථන අංකය |

.

| |
|---|
| S.M.A.N.W. Samarasinghe<br>Justice of Peace<br>No.4, Nawa Mw., Athurugiriya<br>10/07/WP/WI/23<br>Telephone Number |

*උප ලේඛණය V*

**1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනත මගින් දක්වා ඇති නිල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ සාමදාන විනිශ්චයකාරවරුන්**

I. අග්‍ර විනිශ්චයකාරවරයා
II. පාර්ලිමේන්තු විපක්ෂයේ නායකවරයා
III. ශ්‍රේෂ්ඨාධිකරයේ විනිශ්චයකාරවරුන්
IV. අභියාචනාධිකරණයේ සභාපතිවරයා
V. අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරුන්
VI. නියෝජ්‍ය කතානායකවරයා
VII. නියෝජ්‍ය අමාත්‍යවරුන්
VIII. නියෝජ්‍ය කාරක සභාපතිවරයා
IX. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්
X. නීතිපතිවරයා
XI. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා
XII. ජනාධිපතිවරයාගේ ලේකම්වරයා
XIII. අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා
XIV. පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා
XV. විවිධ අමාත්‍යාංශවල ලේකම්වරුන්
XVI. මහාධිකරණයේ විනිශ්චයකාරවරුන්
XVII. පොලිස්පතිවරයා
XVIII. සොලිසිටර් ජෙනරල්වරයා
XIX. විවිධ අමාත්‍යාංශවල අතිරේක ලේකම්වරුන්
XX. නීති කෙටුම්පත් සම්පාදක
XXI. අල්ලස් කොමසාරිස්වරයා
XXII. අතිරේක සොලිසිටර් ජෙනරල්වරයා

XXIII. අතිරේක නීති කෙටුම්පත් සම්පාදක

XXIV. මහා භාරකාරවරයා

XXV. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා

XXVI. නියෝජ්‍ය සොලිසිටර් ජෙනරල්වරුන්

XXVII. විවිධ අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්

XXVIII. පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්වරයා

XXIX. ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා

XXX. අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා

XXXI. නියෝජ්‍ය පොලිස්පතිවරුන්

XXXII. ජ්‍යෙෂ්ඨ රජයේ නීතිපතිවරුන්

XXXIII. රජයේ නීතිඥවරුන් හා විවිධ අමාත්‍යාංශවල සහකාර ලේකම්වරුන්

XXXIV. ශ්‍රේෂ්ඨාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා;

XXXV. අභියාචනාධිකරණයේ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර්වරයා

XXXVI. පොලිස් අධිකාරිවරුන් සහ ආධුනික සහකාර පොලිස් අධිකාරීවරුන් නොවන සහකාර පොලිස් අධිකාරිවරුන්

XXXVII. මහාධිකරණ රෙජිස්ට්‍රාර්වරයා

XXXVIII. පාර්ලිමේන්තුවේ සභානායකවරයාගේ ලේකම්වරයා

XXXIX. පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ ලේකම්වරයා

XL. කම්කරු විනිශ්චය සභා ලේකම්වරයා

*උප ලේඛණය VI*

## නිල බලයෙන් පත්වන ශ්‍රී ලංකාවේ කොටස් සඳහා සාමදාන විනිශ්චයකාරවරුන්

I. දිසා අධිකරණයේ විනිශ්චයකාරවරුන්, පවුල් අධිකරණ විනිශ්චයකාරවරුන්, මහේස්ත්‍රාත්වරුන් ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරුන්, කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්, තම අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශය සඳහා ද,

II. දිසා අධිකරණයන් හි අධිකරණ බල සීමා තුළ කටයුතු කරන කාතිවරුන් ඒ දිස්ත්‍රික්ක සඳහා ද,

III. දිසා අධිකරණයන් හි අධිකරණ බල සීමා තුළ පදිංචිව සිටින කාති මණ්ඩලවල සාමාජිකයන් ඔවුන් පදිංචිව සිටින ඒ දිස්ත්‍රික්ක සඳහා ද,

IV. මහාධිකරණයේ අතිරේක රෙජිස්ට්‍රාර්වරුන් එකී අධිකරණ බල සීමා සඳහා ද,

V. දිසා අධිකරණවල, පවුල් අධිකරණවල, මහේස්ත්‍රාත් අධිකරණවල, ප්‍රාථමික අධිකරණවල රෙජිස්ට්‍රාර්වරුන් සහ කම්කරු විනිශ්චය සභාවල සහකාර ලේකම්වරුන් ඒ ඒ අධිකරණවල හෝ කම්කරු විනිශ්චය අධිකාරිවල අධිකරණ බලසීමාව සඳහා ද,

VI. දිස්ත්‍රික් ලේකම්වරුන් තම තමන් සේවය කරන පරිපාලන දිස්ත්‍රික්ක සඳහා ද,

VII. අතිරේක දිස්ත්‍රික් ලේකම්වරුන් තම තමන් සේවය කරන ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්ක සඳහා ද,

VIII. ප්‍රාදේශීය ලේකම්වරුන් තම තමන්ගේ ඒ ඒ බලසීමා ප්‍රදේශ සඳහා ද,

IX. 1991 අංක 29 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත ප්‍රකාරව පළාත් සභා සියලු මන්ත්‍රීවරුන් අදාළ ප්‍රදේශ සඳහාත්, මහා නගර සභාවල හා නගර සභාවල සභායකයන් අදාළ බල ප්‍රදේශ සඳහාත්, ප්‍රාදේශීය සභා සභාපති, උප සභාපති හා සෙසු සභායකයන් ද තමන්ගේ අදාළ බල ප්‍රදේශ සඳහාද

නිල බලයෙන් සාමදාන විනිශ්චයකරුවන් ලෙස කටයුතු කරනු ලැබේ.

*උප ලේඛණය VII*

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45 වන වගන්තියේ 1(අ) වන උපවගන්තියට අනුව අධිකරණ අමාත්‍යතුමා විසින් සාදන ලද නියෝග අනුව නිල බලයෙන් පත්වන සාම විනිසුරුවරුන්.**

| අනු අංකය | නිල නාමය | බල ප්‍රදේශය | ගැසට් නිවේදනය |
|---|---|---|---|
| 01 | විභාග කොමසාරිස්වරු | මුළු දිවයින | 2021.05.03 දිනැති හා අංක 2226/12 |
| 02 | නියෝජ්‍ය විභාග කොමසාරිස්වරු | මුළු දිවයින | 2021.05.03 දිනැති හා අංක 2226/12 |
| 03 | ග්‍රාම නිලධාරි | පත් කර ලැබ සිටින ග්‍රාම නිලධාරි වසම අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | 2016.02.18 දිනැති හා අංක 1954/34 |
| 04 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි | පත් කර ලැබ සිටින පලාතේ | 2023.08.29 දිනැති හා |

| | | | |
|---|---|---|---|
| | | පරිපාලන දිස්ත්‍රික්කය | අංක 2347/10 |
| 05 | ඡාතික ඒකාබද්ධතා සම්බන්ධීකරණ නිලධාරි | පත් කර ලැබ සිටින ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස ය අයත් පරිපාලන දිස්ත්‍රික්කය . | 2023.08.29 දිනැති හා අංක 2347/10 |
| 06 | පරිපාලන ග්‍රාම නිලධාරි | මුළු දිවයින | 2023.07.04 දිනැති හා අංක 2339/06 |
| 07 | සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් පත් කරන ලද සමථකාරවරුන් | පත් කර ලැබ සිටින සමථ මණ්ඩල බල ප්‍රාදේශය | 2025.06.13 දිනැති හා අංක 2440/27 |